පන්හිඳයි ප්‍රින්සලයි

සිසිර දිසානායක

ගමේ ගිහින් එන්න ගියා....

නෑසෙක් දැක්කා වාගේ... තවමත් හොසේදුව කලිසම් සාක්කුවෙන් ඊමට වැටුණ රුපියලේ කාසිය අහිඳ ගිහිමින් පන්හිඳ කිව්වා.
මගේ පසුම්බියෙන් තිබුණා රුපියල් පහේ නෝට්ටුවක්.. පසුම්බිය අතට ගත්ත පින්සල නෝට්ටුව ආරගෙන අතින් මැදලා දෙකට නවලා තමන්ගෙ ගමන් බලපත්‍රය ඇතුලෙන් තිව්වා.

පන්හිඳයි පින්සලයි දෙන්නාටම පහුගිය සති තුන හීනයක් වගේ. ලංකාවෙ ගත වුණ ඒ සති තුන ගැන සිහිපත් වෙන මොහොතක් පාසා දෙන්නාටම ඇති වෙන්නෙ කියන්න බැරි තරමේ දුකක්.

පින් පන් දෙපල එන තුරු දුරකථන ඇමතුම් දී දී මග බලාගෙන උන්නු හාදයෙක් තමයි සහන් රන්වල. ලයනල් රන්වල උන්නැහේ ගේ බාල පුත්‍ර රන්තය.
ලයනල් රන්වල මහත්තයන් ගැන යමක් ලිව්වොත් නරකද මේ වෙලාවෙ..? පින් යෝජනා කළා.
ඔස්ට්‍රේලියාවෙ වාසය කරන ශ්‍රී ලාංකේය සමිතියක් ඇති අපේ ජන කොට්ඨාශයේ අවධානයට මෙතෙක් යොමු නොවුණ ඉසව් කරා දොර පියන් හැර පියාලීම පන්හිඳයි පින්සලයි ලිපියේ ප්‍රධාන අරමුණකි. ඉඩ ප්‍රස්ථාව ඇති අන්දමට එම අරමුණ කරා යොමු වීමට අපි සැමවිටම උත්සාහ දරන්නෙමු.. පන් පූර්වීකා-වක් ලිව්වා.

හයේ දශකයේ අග භාගයේ දී ශ්‍රී ලංකාවේ ඇරඹුණා වූ කලා පුනරුදයේ එක් විශේෂ අංගයක් වූයේ සිංහල ගීතය යි. හිත්දි හා ද්‍රවිඩ සිනමා ගීත වලින් යටපත්ව තිබූ සිංහල කම සොයා යන්නට රූපසිංහ මාස්ටර්, සුගිල් ශාන්තයන්, පණ්ඩිත් අමරදේ-වයන් වැන්නවුන් ගත් මඟට වෙනස් වූ රටාවක් ද බිහි විය. ඒ ගැමි කවි සී පද, වන්හමි, සවිදම් පහනැදිය පෙරටු කොට ගත් ජන සංගීතයයි. එවකට රජයේ සංගීතායතනයෙහි කථිකා-චාර්යවරයෙකු වූ මඤ්ලොළුව විද්වතා මෙහිලා පුරෝගාමී මෙහෙවරක යෙදුණේ ය. ගම් දනව් කරා ගොස් ජන ගී එක් රැස් කරමින් හා පටිගත කරමින් හෙන ගියා වූ මෙම සද්කාර්යයට උර දුන් එතුමන්ගේ සිසුවන් අතර මුලටම කියැ-වෙන නම් දෙකකි. ලයනල් රන්වල හා රෝහණ බස්දගේ. පණ්ඩිත් අමරදේවයන් හා ඒතරාද හන්දා මාලිගිය ද ජන ගී රටා අසුරු කොට සිය තනු නිමිවා ගත් හිරිමාපකෝ වූහ. ඇතැම් පසු කාලීනයෝ ද එම ඇසුර ලැබූ හ.

සෘජුවම ජන ගී රටා සම්මිශ්‍රණය කොට තනු නිර්මාණය කිරී-මෙහි ලා වඩාත් ප්‍රමඛස්ථානයක් ලයනල් රන්වල එසින් ගන්නා ලදී. ඒ අනුව පද යොදා ප්‍රසාංගිකව ඉදිරිපත් කිරීමෙහි ලා එතුමා දැක්වූයේ අපූරු හැකියාවකි. ගායනයට මෙන්ම වාදනයට, රංගනයට, නර්තනයට, දේශණයට පමණක් නොව පද රචනයටද උපන් හපනෙක් එය හෝ. තම අදහස් සෘජුවම කියා පාමින් ජන ගීය වෙනුවෙන් යුද වැදි රන්වල සිය ජන ගී ප්‍රසංගය නම් කළේ ද යුද්දෙටත් අවිත් නමිනි. වසර තුනකට පෙරාතුව අකල් වියෝවට පත් එතුමන්ගේ එම ක්‍රියා දාමය අද කර පින්නාගෙන සිටිනුයේ ඔහුගේ කණිටු පුත් සහන් රන්වලයි. ලයනල් රන්වල ජන ගී කන්ඩායම එසින් පවත්වාගෙන යන ගම අවුලැස්සැං ජන ගී ප්‍රසංගය අද බාල තරුණ මහළු කා අතරත් ජනප්‍රියව ඇති බව පෙනෙයි. සියය ඉක්මවූ ප්‍රසංග වාර ඉහළ හැංවීමට විශාරද වසන්තා මධුරාංගනී, ඇතැම් යො-වුන් ශිල්පී ශිල්පිණියන් සහන් වටා රොද බැඳ සිටිනුයේ සො-යුරු කැලක් ලෙසිනි. කුසලතා සපිරි මෙවන් කණ්ඩායමක් හාස්‍යෝත්පාදන ප්‍රසාංගික රටාවකින් සමාජයට දායාද කර දෙන හර පද්ධතිය පිළිබඳව සමාජයේ දැස් යොමු වීය යුතුව ඇත්තේ එය අද එරට රැල්ලක් බවට පත්ව ඇති හිසාම නොවේ.

තිබ්බා නේද තිත..? පින් ඇහුවා.
ඇති නේද..? පන් තීන්ත කුප්පියට එබෙන ගමන් ඇහුවා.

පන්හිඳෙයි පින්සලෙයි මුතුන් මිත්තන්ගේ හපන් කම් ආයෙත් සිහිපත් කර ගන්නටම දරු මුණුපුරන්ට පෙන්වන්නටත් සීගිරියට ගිය ගමන පන්වත් පින් ටත් හරියට වව්නවා. ලෝකෙ පුරා ප්‍රසිද්ධ වුණේ පින්ගේ මුතුන් මිත්තන් ඇඳපු සිතුවම්. ඒ දිහා බලාගෙන කැඩපත් පවුරෙ කවි ලිව්වෙ පන්ගේ මුතුන් මිත්තන්.

සීගිරිය ගැන නම් මෙපෙම යන්නමට ලියන්න බෑ.. වෙනමම ලියන්න ඕනෑ.. පන් කිව්වා.
ඇත්ත නේන්නම්.. ගෘහ නිර්මාණ ශිල්පය, වාරි කළමනාකරණය, උද්‍යානාලංකරණය.. තව මොන තරම් සේවල් තියෙනවද සීගිරිය ගැන ලියනවා නම්.. පින් අලුතු තිව්වා.

සුනාමි හටඹුන් බලාගෙන ගාලු කොටුවට ගිය ගමන නම් හරම සංවේග ජනකයි. දෙන්නා ගාලු යිගේ පන්ගේ පූර්වාචාර්ය සෙනෙකු මුණ ගැහෙන්න. ඒ ශ්‍රී ලංකාවේ අග්‍ර ගණ්‍ය කිව් රන්න ශ්‍රී වීජේසිංහ මහත්මයා.
එතුමා මුහුදු සුනාමියට එතරක් හෙවෙයි දේහපාලන සුනාමියකටත් අතුවෙලා..

කට කට... කොහේ කියලා හිතුවද..? පන් පින්ගේ කට අතින් තද කලා.
සිර ලංකාව නේද..? මං උන්නේ මෙල්බන් කියලා.. පින් ලැජ්ජාවෙන් වගේ කෙඳිරුවා.

ගාල්ලේ කොටුවේ පිදැංචි ඒ ඉන්න රත්න ශ්‍රී වීජේසිංහයන්ගේ හිවස සුනාමි එපාතේ දී ජලයෙන් යට වී ගිය අතර එහි වූ වව්නා ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් විනාශ වී තිබේ. ඒ අතර දුර්ලභ පුස්තකාල පොත් කීපයක් ද වේ. තද සැසඩ හපරට හසු නොවූ හිසාවෙන් ගෘහය ආරක්ෂා වුව ද අදද බිත්ති තෙත්ව එදා ජල මට්ටම කියවයි. වාසනාවකට මෙන් එවේලෙහි සිය පවුලේ උදවිය සමග

බසරෙක ගොස් සිටි හිසාවෙන් ජීවිත ඛේරා ගැනීමට හැකි වී ඇත්තේ ය. ගඟෙන් වැටුණ මහිහාට ගොනා ඇත්නා සේ මව්ටිම අද එතුමන්ගේ රැකියාවද අහිමි කොට ඇත. අද වන තුරු වීශ්‍රාම වැටුපක් හෝ වෙන කිසියම් ම හෝ ගෙවීමක් නාලද මේ වීයතා අද දින ගණින්නේ සිය නෑ හිත මිතුරන් ගේ දින දසුන් වීලිනි. සුනාමි නමින් උපකාර කරන්නහන්ගේ අවධානය පටේ මෙවැනි සම්පත් රැක ගැනීමට යොමු වන්නේ නම් එය පාතිකා යුතු කමක් වන්නේ ය. වඩාත ලද බුද්ධිය හෝ ඳොණය කුමන අන්දමක සුනාමියකටවත් පැහැරෙ ගත නොහැකි හිසා ය ඒ. නැණ නුවණ අද මව් ඊමට අත්‍යවශ්‍ය වී තිබේ.. පන් ලිව්වා.
ඇත්ත තමයි.. පින්ට හිතුණා.
එදා වාගෙම අදත් හැම අතින්ම හපන් කම් පෙන්වන අය ඉන්නවා.. ඒ අයගේ හපන් කම් රටට වැඩක් ඇති වීදිහට ගොනු කරගන්න ඕනෙ.. නැණ නුවණයි හිඟ..
එවේලේම කැටයම් කපලා වෙළඳපළට ඉදිරිපත් කරන තරුණ ශිල්පීන්ව කොටුව ලක්සලේදී මුණ ගැහුණ පින්ට එසින් එකක් අඳින්න හිතුණා.
රජ කාලේ කලා කැටයම් කළාට සන්දේශ යැව්වාට අද කාලේ ආසාවටවත් කුකුලෙක් දකින් නෑ ලංකාවේ.. පින් අඳිමින් උන්න සැවුලෙකු මුල් කරගත් කැටයෙම දැකපු ගමන් පන් ට කියවුණා. ඒකටත් එක්ක මෙතෙ.. පුදුම ආදරයක් තියෙන්නෙ කුකුල්ලුන්ට.. පින් හිස උස්සන්නෙ නැතුවම කියලා දැම්මේ සායම් බොදද වේවි කියලා බයට වෙන්න ඇති.